ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**இலங்கைமனிதஉரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

# කාර්යසාධන වාර්තාව

# **செயலாற்றுகை அறிக்கை**

# Performance Report

**01 වන කාර්තුව 2019**

**01 ஆம்காலாண்டு 2019**

**01st Quarter 2019**

## කාර්යසාධන වාර්තාව - 01 වන කාර්තුව
## 2019 ජනවාරි සිට මාර්තු දක්වා

### හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 වර්ෂයේදී, 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කෙරිණි. මානව හිමිකම් කොමිෂන් සභාවේ නෛතිකමය පදනම සහ මෙහෙයුම් මූලධර්මයන් එකී පනතෙහි දක්වා ඇත. මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි යොමුගතව ඇති නමුදු එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිමත්ව ස්ථාපිත කරන ලද්දක් නොවේ. කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන යටතේ පත් කරනු ලබති.

මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි බලසීමාව පනතෙහි විග්‍රහ කර ඇත. මූලික අයිතිවාසිකම් වනාහී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවෙහි III ඡේදය යටතේ සහතික කර ඇති යම් යම් සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් මෙන්ම ආර්ථික, සමාජීය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් වේ. මානව අයිතිවාසිකම් ජාත්‍යන්තර නීතියෙහි විග්‍රහ කර ඇත.

කොමිෂන් සභාවෙහි කාර්ය භාරයන් වන්නේ :

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දැක්වෙන විධිවිධානයන්ට අනුගතවීම සහතිකවීම උදෙසා ක්‍රියාපරිපාටීන්ට අදාළ පැමිණිලි හෝ මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ සමීපස්ථව සිදුවිය හැකි කඩකිරීම් සම්බන්ධයෙන් පරික්ෂා කිරීම හෝ විමර්ශනය කිරීම.

- මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම් සඳහා නීතිමාලා සහ පරිපාලන නියෝග සහ ක්‍රියාපටිපාටි සම්පාදනය කිරීමෙහි ලා රජයට උපදෙස් දීම හා සහාය වීම.

- ජාතික නීතිමාලා සහ පරිපාලන ව්‍යවහාර ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුගත බවට සහතික වීම සඳහා රජයට යෝජනා ඉදිරිපත් කිරීම.

- ජාත්‍යන්තර ගිවිසුම් සහ වෙනත් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥප්ති වලට අත්සන් තැබීම හෝ එකඟ වීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම.

- මානව හිමිකම් සම්බන්ධ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ මානව හිමිකම් ආශ්‍රිත අධ්‍යාපනය සලසාදීම (1996 අංක 21 දරණ පනතේ 10 වන කොටස)

කොමිෂන් සභාව 151 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සහිතව ක්‍රියාත්මක විය. කොමිසමෙහි කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා පරීක්ෂණ හා විමර්ශන, අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්, පර්යේෂණ හා අධීක්ෂණ, පරිපාලන හා මුදල් යන අංශ වලින් මෙන්ම ප්‍රාදේශීය කාර්යාල 10කින් (අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුනේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය හා වවුනියාව) සමන්විතය. සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකු යටතේද සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරියකු යටතේ ද ක්‍රියාත්මක වේ. එකී අංශ මෙන්ම ප්‍රාදේශීය කාර්යාල සභාපති සහ/හෝ කොමසාරිස්වරයෙකු/කොමසාරිස්වරු විසින් අධීක්ෂණය කෙරේ.

මෙම කාලවකවානුව තුළදී කොමිෂන් සභාව විසින් බොහෝ ක්‍රියාකාරකම් දියත් කරන ලද අතර, එම ක්‍රියාකාරකම් වාර්තාවෙහි විග්‍රහ කර ඇත.

ආයතන දෙකට අත්තනෝමතික අතුරුදහන්කිරීම්වලට අදාළ ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයෙහි යෙදීමට හැකිවනු පිණිස අවබෝධතා ගිවිසුමකට එළඹීමේ හැකියාව විමසා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් මෙම කාර්තුව තුළදී, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය සමග සාකච්ඡා පවත්වන ලදී.

## ප්‍රධාන කාර්යාලය - පැමිණිලි සාරාංශය

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව | 996 |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය පථය යටතේ ලා ගැණෙන පැමිණිලි සංඛ්‍යාව | 338 |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය පථය යටතේ ලා නොගැණෙන සහ සුදුසු කටයුතු සඳහා වෙනත් ආයතන වලට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව (ඉදිරියට කටයුතු කළ නොහැකි) | 618 |
| තොරතුරු ලැබිය යුතු පැමිණිලි | 40 |

## ප්‍රධාන කාර්යාලයමගින්පරීක්ෂණ කටයුතු නිම කළ පැමිණිලි

| කටයුතු නිම කළ පැමිණිලිවල වර්ගීකරණය | විභාග කටයුතු නිම කළ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| නිර්දේශ නිකුත් කළ පැමිණිලි සංඛ්‍යාව | 16 |
| සමථකරණය කළ පැමිණිලි සංඛ්‍යාව | 14 |
| අනෙකුත් හේතු මත නිම කළ පැමිණිලි සංඛ්‍යාව(ඉල්ලා අස්කර ගැනීම්, උනන්දුවක් නොදැක්වීම්, මූලික අයිතිවාසිකම් කඩනොවීම්) | 781 |

## ප්‍රාදේශීය කාර්යාල -පැමිණිලි සාරාංශය

| පැමිණිලිසාරාංශය | අම්පාර | අනුරාධපුර | බදුල්ල | මඩකලපුව | යාපනය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලද පැමිණිලි සංඛ්‍යාව | 43 | 157 | 64 | 96 | 80 | 50 | 135 | 149 | 32 | 68 |
| විෂය පථය යටතේ ලා ගැණෙනපැමිණිලි සංඛ්‍යාව | 33 | 132 | 55 | 86 | 80 | 49 | 143 | 127 | 30 | 64 |
| විෂය පථය යටතේ ලා නොගැණෙනපැමිණිලි සංඛ්‍යාව | 10 | 25 | 09 | 10 | - | 01 | 15 | 22 | 2 | 04 |
| වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි | - | - | - | 79 | 05 | - | - | - | - | - |
| සමථයට පත් කරන ලද පැමිණිලිසංඛ්‍යාව | 01 | 51 | 05 | 07 | 28 | 23 | 140 | - | 1 | 22 |
| නිර්දේශ සඳහා ප්‍රධාන කාර්යාලයටයොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 03 | 08 | 8 | -- | 01 | - | 01 | 4 | - | 03 |
| ප්‍රාදේශීය කාර්යාල විමසුපුද්ගලයන් සංඛ්‍යාව | 124 | 221 | 108 | 175 | 444 | 135 | 251 | 346 | 166 | - |
| අවසන් කළ පැමිණිලි | 26 | 144 | 31 | 26 | 30 | 60 | 144 | 137 | 33 | 75 |

## ස්වයං සිද්ධි (Suo/Motu) පැමිණිලි මෙහෙයවීම

මෙම කාර්තුව සඳහා පරීක්ෂණ සහ විමර්ශන අංශය මගින් කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සිය මෙහෙයවීමෙන් සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව 08ක් වන අතර, ඒ සම්බන්ධව විමර්ශන ආරම්භ කොට ඇත.

| | සිද්ධියේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වධහිංසා පැමිණවීම් | 04 |
| 02 | අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම | 01 |
| 03 | අත්අඩංගුවේ සිටියදී මිය යෑම | 02 |
| 04 | බලෙන් අතුරුදහන් කරවීම | 01 |

ඉහත සඳහන් කළ විමර්ශනවලට අදාළ ස්වයං සිද්ධි සාරාංශ පහත පරිදි වේ.

- HRC/Suo/Motu/01/19යටතේ ඊ. ඒ. පී. සිල්වානමැතිඅය 2019.01.07 දින වැලිකඩබන්ධනාගාරයේදීමියයාමසම්බන්ධයෙන්විමර්ශනයක් ආරම්භ කර ඇත.

- HRC/MT/Suo/Motu/01/19 යටතේ2019.01.23 දින හෝ ඊට ආසන්න දිනකදී රත්ගම පොලිස් වසමේ පුද්ගලයන් දෙදෙනෙකු පැහැර ගෙන ගොස් ඝාතනය කර පුළුස්සා දැමීම සම්බන්ධයෙන් මාධ්‍ය මගින් අනාවරණය වූ කරුණු අනුව විමර්ශනය ආරම්භ කර ඇත. ඉන් අනතුරුව මෙම සිද්ධියට අදාළව HRC/MT/79/19, HRC/MT/576/19, HRC/MT/581/19 පැමිණිලිලැබීඇත. එමපැමිණිලිදමෙමපැමිණිල්ලසමගසම්බන්ධකොටඉදිරිවිමර්ශනකටයුතුසිදුකරනුලබයි.

- HRC/Suo/Motu/02/19යටතේකුරුවිටබන්ධනාගාරයේබන්ධනාගාරගතවසිටියදී 2018.12.22 දින හෝ ඊට ආසන්න දිනකදීඑම්. එස්. රම්‍යසිරි නොහොත් ජෝන් සීනායනඅය ගෙල වැළලාගෙන මියයෑමසම්බන්ධයෙන් විමර්ශනයක්ආරම්භ කොටඇත.

- HRC/Suo/Motu/03/19 යටතේ2019.01.21 දින හෝ ඊට ආසන්න දිනකදී අවිස්සාවේල්ල පුවක්පිටිය ජනචිරු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේදී බාල වයස්කාර මොහොමඩ් අසාඩ් නමැති අයට වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ලැබී ඇති තොරතුරු අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

- HRC/Suo/Motu/04/19සහHRC/Suo/Motu/08/19යටතේසුදත්ද සිල්වායනරුඳවියා වැලිකඩ බන්ධනාගාරයේදී වධහිංසාවට පත්වීමසම්බන්ධයෙන්කොමිෂන්සභාවටලැබුණුතොරතුරුමතවිමර්ශනආරම්භකරඇත.

- HRC/Suo/Motu/05/19යටතේ සමාජ මාධ්‍ය හරහා ඉදිරිපත් වූ තොරතුරු මත2019.03.13 දින හෝ ඊට ආසන්න දිනකදී රිදීගම පොලිස් ස්ථානයේ නිලධාරියකු විසින් පුද්ගලයකු වධහිංසාවට ලක් කරමින් අත්අඩංගුවට ගැනීමේ සිද්ධිය පිළිබඳව විමර්ශනයක් ආරම්භ කර ඇත.

- HRC/Suo/Motu/06/19 යටතේ 2019.03.13 දින හෝ ඊට ආසන්න දිනකදී පාර්ලිමේන්තු වටරවුම අසල අන්තර් ශිෂ්‍ය බල මණ්ඩලය විසින් පැවැත්වූ විරෝධතා හේතුවෙන් එහි කැඳවුම්කරු මහිල් බණ්ඩාර දෙහිදෙනිය යන අයව අත්අඩංගුවට ගැනීම හා එහිදී ඇති වූ තත්ත්වය පිළිබඳව 2019.03.14 දින මවුබිම හා දිනමිණ පුවත්පත්වල පළ වූ තොරතුරු මත පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

- HRC/Suo/Motu/07/19 යටතේ 2019.03.22 දින හෝ ඊට ආසන්න දිනකදී පුත්තලම ප්‍රදේශයේ පැවති මහජන උද්ඝෝෂණයක් විසුරුවා හැරීමේදී ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින්

පුද්ගලයින් තිදෙනෙකුට පහරදීම සම්බන්ධයෙන් මාධ්‍ය මගින් අනාවරණය වූ තොරතුරු මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**විශේෂ අධීක්ෂණ**

| දිනය | මැදිහත්වීමට හේතු වූ ගැටලුව |
|---|---|
| 2019.01.07 | HRC/1357/18/D/R & M අංකයදරණ පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසීම සඳහා සහ මේවන විට පවතින ප්‍රගතිය සම්බන්ධයෙන් වලපනේ ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් කරුණු විමසීම සඳහා මෙම සාකච්ඡාව පවත්වන ලදී. |
| 2019.01.10 | HRC/2342/18/SUO/MOTU/R & M අංකයටතේස්වයංමැදිහත්වීමක්සිදුකරනලද මෙම ගැටලුවට අදාළව සමාලෝචන රැස්වීමක් පවත්වන ලදී. ඒ සඳහා තැපැල්අමාත්‍යාංශය, තැපැල්දෙපාර්තමේන්තුව, සබරගමුවපළාත්නියෝජ්‍ය තැපැල්පති, වතුයටිතලපහසුකම්අමාත්‍යාංශය යන ආයතනවල නියෝජිතයින් සහභාගී විය. |
| 2019.01.11 | HRC/1638/18/D/R & M අංකයදරණ පැමිණිල්ල රථවාහන වැරදි සඳහා අයකරන දඩමුදල් ඉහළ දැමීමට විරුද්ධව සිදුකරන ලද්දකි. එය ලංකා ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ත්‍රීරෝද රථ සම්මේලනය, ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමය, ආපනශාලා හිමියන්ගේ සංගමය සහ සමස්ත ලංකා යතුරුපැදිකරුවන්ගේ සංගමය යන සංගම් මගින් යොමුකරන ලද්දකි. මේ සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, මොරටුව මහ නගර සභාව, පොලිස් දෙපාර්තමේන්තුව යන ආයතන වල නියෝජිතයින් සමඟ ගැටලු සාකච්ඡා කරන ලදී. |
| 2019.01.24 | HRC/2342/18/SUO/MOTU/R & M අංකයටතේස්වයංමැදිහත්වීමක්සිදුකරනලද මෙම ගැටලුවට අදාළව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. |
| 2019.03.14 | HRC/2342/18/SUO/MOTU/R & M අංකයටතේස්වයංමැදිහත්වීමක්සිදුකරනලද මෙම ගැටළුවට අදාළව තැපැල්අමාත්‍යාංශය, තැපැල්දෙපාර්තමේන්තුව, සබරගමුවපළාත්නියෝජ්‍ය තැපැල්පති, වතුයටිතලපහසුකම්අමාත්‍යාංශය සහ ස්වදේශ කටයුතුඅමාත්‍යාංශයදසම්බන්ධ කරගනිමින් විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. |
| 2019.03.28 | HRC/817/19 අංකයදරණ පැමිණිල්ලට අදාළව පැමිණිලි පාර්ශවය සහ වගඋත්තර පාර්ශවය වන මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දෙවන කොටස සහ මාර්ග සංවර්ධන අධිකාරිය කැඳවන ලදී. මෙම පැමිණිල්ල සංවර්ධන කටයුතු නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන ජනතාවට සිදුවන සෞඛ්‍යමය තර්ජනයන් සම්බන්ධයෙන් යොමු වූවකි. |

**<u>රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීම් පිළිබඳ සාරාංශය</u>**

| ස්ථානය | ප්‍රධාන කාර්යාලය | ප්‍රාදේශීයකාර්යාල | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අම්පාර | අනුරාධපුර | බදුල්ල | මඩකලපුව | යාපනය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රි'මළය | වවුනියාව |
| පොලිස් ස්ථාන | 176 | 17 | 10 | 45 | 27 | 52 | 16 | 96 | 44 | 19 | 53 |
| බන්ධනාගාර | 06 | 02 | - | 2 | 06 | 04 | - | 02 | 1 | 02 | 01 |
| ළමා සත්කාරක/ළමා රැඳවුම් නිවාස | 01 | 02 | - | - | 03 | - | 07 | 01 | 02 | - | - |
| වැඩිහිටි නිවාස | - | 02 | - | - | - | - | 02 | - | - | - | - |
| පුනරුත්ථාපනමධ්‍යස්ථාන | 2 | - | - | - | - | - | - | - | - | - | 01 |
| අපරාධ විමර්ශන/ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ | 2 | - | - | - | - | - | 01 | - | - | - | 02 |
| ආබාධිත නිවාස | - | - | - | - | 01 | - | 01 | - | - | - | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශේෂ | - | - | - | - | 02 | - | - | - | - | - | 01 |
| එකතුව | 187 | 23 | 10 | 47 | 39 | 56 | 27 | 99 | 47 | 21 | 58 |

## <u>රාජ්‍ය ආයතන වෙත නිකුත් කර ඇති නිර්දේශ</u>

| අංකය | පැමිණිලි අංකය | වගඋත්තරකාර ආයතනය | පැමිණිල්ලේ ස්වභාවය | නිර්දේශය නිකුත් කල දිනය | උල්ලංඝණය වී ඇති මූලික අයිතිවාසිකම් | නිර්දේශය ක්‍රියාත්මක වීම (ඇත ✓ නැත x) |
|---|---|---|---|---|---|---|
| 01 | HRC/1729/17 | රාජකීය විද්‍යාලය කොළඹ | නොසලකා හැරීම් | 2019.01.03 | 12(1) (2) | **x** |
| 02 | HRC/AP/475/17<br>HRC/AP/498/17 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | බඳවා ගැනීම් | 2019.01.03 | 12(1) | **x** |
| 03 | HRC/1983/17 | අධ්‍යාපන අමාත්‍යාංශය | ක්‍රියාත්මක නොකිරීම් | 2019.01.25 | 12(1) | ✓ |
| 04 | HRC/1576/16 | සී/ස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | බඳවා ගැනීම් | 2019.01.28 | 12(1) | **x** |
| 05 | HRC/237/17 | යශෝධරා දේවි බාලිකා විද්‍යාලය ගම්පහ | පාසලට ඇතුළත් කර නොගැනීම් | 2019.02.08 | 12(1) | **x** |
| 06 | HRC/AM/150/15/S/EM<br>HRC/AM/72/16/T/EM | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක අම්පාර | ස්ථාන මාරුවීම් | 2019.02.08 | 12(1) | **x** |
| 07 | HRC/368/18 | රාජකීය විද්‍යාලය කොළඹ | පාසලට ඇතුළත් කර නොගැනීම් | 2019.02.08 | 12(1) | **x** |
| 08 | HRC/K/105/17 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | ස්ථාන මාරුවීම් | 2019.02.08 | 12(1) | ✓ |
| 09 | HRC/3578/17 | රාජකීය විද්‍යාලය කොළඹ | පාසලට ඇතුළත් කර නොගැනීම් | 2019.02.15 | 12(1) | **x** |
| 10 | HRC/TCO/27/18 | ත්‍රි/ශ්‍රී ශන්මුගම් හින්දු කාන්තා විද්‍යාලය-ත්‍රිකුණාමලය | අබාය පැළද ගුරුවරුන් පාසලට පැමිණීම | 2019.02.18 | 12(1) | **x** |
| 11 | HRC/AM/78/15/S/ED | අම්/ඩී.එස්.සේනානායක ජාතික පාසල-අම්පාර | පාසලට ඇතුළත් කර නොගැනීම් | 2019.03.18 | 12(1) | **x** |
| 12 | HRC/398/15<br>HRC/1149/15 | යටියන්තොට පොලිස් ස්ථානය | වධහිංසා කිරීම් | 2019.03.22 | 11 | ✓ |

## දැනුවත් කිරීමේ වැඩසටහන්

### දේශනසහාය

| වැඩසටහන් විස්තරය |
| --- |
| 2019.01.17 දින උඩතුත්තිරිපිටිය වැඩිහිටි සංගමයේ සාමාජිකයින් සඳහා උඩුතුත්තිරිපිටිය වැඩිහිටි සමිති ශාලාවේදී පැවති මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනටඅධ්‍යක්ෂ - අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය දායකත්වය ලබාදෙන ලදී. |
| 2019.01.22 දින ශ්‍රී ලංකා යුධ හමුදා මානුෂවාදී හා මානව හිමිකම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සුළුතර අයිතිවාසිකම් පිළිබඳ හමුදා නිලධාරීන් සඳහා කුකුලේගඟ, ශ්‍රී ලංකා යුද හමුදා පුහුණු ආයතනයේදී පැවති දේශනය සඳහා අධ්‍යක්ෂ - අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය දායකත්වය ලබාදෙන ලදී. |
| 2019.03.24 දින ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ පරිසර හා ප්‍රජා සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය විසින් කාන්තා සංවිධාන, සිවිල් සමාජය, මාධ්‍යවේදී සහ තරුණ තරුණියන් වෙනුවෙන් රත්නපුර පැවති වැඩමුළුව සඳහා විමර්ශන නිලධාරී කැලිස්ටස් අරුණ කුමාර මහතා සහභාගී විය. |

### විශේෂ දේශන මාලා

| දිනය | මාතෘකාව |
| --- | --- |
| 2019.01.09 | මානව හිමිකම් ආරක්ෂණ වැඩ: සදාචාරාත්මක හා වටිනාකම - දිශානතිය පිළිබඳ ගැටලු යන මාතෘකාව යටතේ විශේෂ දේශනයක් තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ සාමාජික, එස් ජී පුංචිහේවා මහතාගේ සම්පත් දායකත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යමණ්ඩලය සඳහා පවත්වන ලදී. |
| 2019.03.13 | එච්.අයි.වී / ඒඩ්ස් වෙනස් කොට සැළකීමේ මූලධර්මය යන මාතෘකාව යටතේ විශේෂ දේශනයක්පාලිත බණ්ඩාර මහතාගේ සම්පත් දායකත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යමණ්ඩලය සඳහා පවත්වන ලදී. |
| 2019.03.27 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ විදේශ වැඩමුළුවකට සහභාගී වූ කුමුදුනි විතානගේ මිය, ඒ. සී. ඒ. අසීස් මහතා, ඒ. එස්. නිලන්ත මහතා හා එස්. අරුන් මහතා විසින් උගත් අත්දැකීම් බෙදා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්යමණ්ඩලය සඳහා පවත්වන ලදී. |

### තේමාත්මක අනුකමිටු රැස්වීම්

| දිනය | තේමාත්මක අනු කමිටුව |
| --- | --- |
| 2019.01.21 | LGBTIQ පුද්ගලයින්ගේඅයිතිවාසිකම්පිළිබඳඅනුකමිටුරැස්වීමපවත්වන ලදී. |

### අභ්‍යන්තර රැස්වීම්

| රැස්වීම් | ජනවාරි | පෙබරවාරි | මාර්තු |
| --- | --- | --- | --- |
| කොමිෂන් සභා මාණ්ඩලික රැස්වීම් | -- | 06 | 06, 25 |
| කොමසාරිස් මණ්ඩල රැස්වීම් | 14 | -- | -- |

### පුහුණුවැඩසටහන්

**I. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව**

ශ්‍රී ලංකාමානවහිමිකම්කොමිෂන්සභාවේකාර්යමණ්ඩලයසඳහාපුහුණුකරුවන් පුහුණු කිරීමපිළිබඳවැඩමුළුවසංවිධානයකරනලදී. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල අධ්‍යාපන හා වෙනත් ක්‍රියාකාරකම්වල නිරත ඔවුන්ගේ පුහුණුවැඩසටහන් සංවර්ධන සහ කළමනාකරණධාරිතාවය වැඩිදියුණු කිරීම වැඩමුළුව සංවිධානය කිරීමේ අරමුණ වේ. මෙම නේවාසික වැඩමුළුව 2019 ජනවාරි 25 සිට 27 දක්වා දින තුනක් ගම්පහ, හේනේගම, නෙරලු

හොලිඩේ රිසෝට් හි දී පැවැත්වූ අතර, දේශන හා ක්‍රියාකාරකම් ජාත්‍යන්තර පුහුණුව ලත් පහසුකම් සපයන්නන් දෙදෙනෙකු සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ වැඩි පළපුරුද්දක් ඇති සම පහසුකම් සපයන්නන් දෙදෙනෙකු විසින් සිදු කරන ලදී.

**II. මානවහිමිකම්කොමිෂන් සභාවේ සහායක කාර්ය මණ්ඩලය සඳහා මානව හිමිකම් පිළිබඳ පුහුණු වැඩසටහන - දෙවන අදියර**

මානවහිමිකම්කොමිෂන්සභාවේසහායකකාර්යමණ්ඩලයසඳහාමානවහිමිකම්පිළිබඳපුහුණුවැඩසටහන 2019 පෙබරවාරි 24 සහ 25 යන දෙදින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී පැවැත්විණි. මෙම වැඩසටහනේ මූලික අවධානය යොමු වූයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සහායක කාර්ය මණ්ඩලයටමානව හිමිකම් පිළිබඳ පුහුණුවක් ලබාදීමයි.

## ජාත්‍යන්තර කාන්තා දිනය - ප්‍රධාන කාර්යාලය

### (i) වටමේස සාකච්ඡා

| දිනය | ස්ථානය | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|
| 2019.02.08 | ප්‍රධාන කාර්යාලය, කොළඹ | කොළඹ දිස්ත්‍රික් ආබාධ සහිත පුද්ගල සංවිධාන |
| 2019.02.20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | පුත්තලම දිස්ත්‍රික් ආබාධ සහිත පුද්ගල සංවිධාන |
| 2019.03.01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කුරුණෑගල | කුරුණෑගල දිස්ත්‍රික් ආබාධිත කාන්තාවන් |
| 2019.03.05 | රත්නපුරලේකම් කාර්යාලය,රත්නපුර | රත්නපුර දිස්ත්‍රික් ආබාධිත කාන්තාවන් |

### (ii) ජාත්‍යන්තරකාන්තාදිනයසැමරුම

2019 මාර්තු මස 08 වන දින ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් "ගෞරවනීය ජීවිතයක් සඳහා ප්‍රධාන ධාරාවට ගෙන ඒම" යන තේමාව යටතේ ආබාධිත කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳවට මේස සාකච්ඡාවක් ශ්‍රී ලංකා පදනම, කොළඹ 07 හිදී සංවිධානය කරන ලදී. එහිදී අධ්‍යාපනය, සෞඛ්‍ය, සේවා නියුක්තිය, පවුල් කටයුතු යන කාණ්ඩ හතර යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කලාපිය මට්ටමින්පැවති වට මේස සාකච්ජා වලදී මතුවූ අදහස් පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කරන ලදි . කාන්තා දින උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ වෛද්‍ය ශෂිකා ජයලත් ය. වට මේස සාකච්ඡාව මහාචාර්ය චන්ද්‍ර ගුණවර්ධන මහත්මිය සහ නීතිඥ තනුජා නවරත්න මහත්මිය විසින් මෙහෙයවන ලදී.

## ජංගම සේවය/වෙනත් වැඩසටහන්

| දිනය | මාතෘකාව |
|---|---|
| 2019.03.10 | කළුතර,දොඩංගොඩ, කොස්වත්ත ජනාධිපති විද්‍යාලයේ දී ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් පවත්වන ලද වැඩසටහන සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සහභාගී වන ලදී. |
| 2019.03.24 | කොළඹ - 15, මෝදර හින්දු විද්‍යාලයේ දී ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් පවත්වන ලද වැඩසටහන සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සහභාගී වන ලදී. |
| 2019.03.30 | ශ්‍රී ලංකා පවුල් සංවිධානය විසින් සංවිධාන කරන ලද LGBTIQ පුද්ගලයින් සම්බන්ධයෙන් මානව හිමිකම් අනු කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ජාව. |
| 2019.03.31 | අවිස්සාවේල්ල, ශාන්ත මේරි විද්‍යාලයේ දී ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් පවත්වන ලද වැඩසටහනසඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සහභාගී වන ලදී. |

**ආබාධ සහිත පුද්ගලයන්ට රාජ්‍ය ගොඩනැගිලි සහ ප්‍රවාහන පහසුකම් වෙත ප්‍රවේශ විය හැකි පරිදි වාර්ෂික අයවැයෙන් අරමුදල් සම්පාදනය කිරීම**

ජාතික නීතිවලට අනුකූලව ආබාධිත පුද්ගලයින්ට රාජ්‍ය ගොඩනැගිලි සහ ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා 2019 අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ගරු මුදල් ඇමති මංගල සමරවීර මහතා වෙත2019.01.10 දින නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**ආබාධිතඅයිතිවාසිකම්නීතිසම්පාදනයපිළිබඳපනත් කෙටුම්පත්සඳහාශ්‍රීලංකාමානවහිමිකම්කොමිෂන්සභාවේනිර්දේශය**

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආබාධිත අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධව කොමිෂන් සභාවේ නිර්දේශයන් සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යවරයා වෙත 2019.01.29 දින ඉදිරිපත් කරන ලදී. ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ තේමාත්මක අනු කමිටුව සමඟ සාකච්ඡා කර මෙම නිර්දේශ සකස් කරන ලදී.

**මානවහිමිකම්ප්‍රකාශන**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මුද්‍රණය කරන ලද මානව හිමිකම් ප්‍රකාශන, අත් පත්‍රිකා සහපෝස්ටර් පාසල් හාවිශ්ව විද්‍යාල සිසුන්, හමුදා හා පොලිස් නිළධාරීන්,රජයේ ආයතන කාර්ය මණ්ඩල, රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයන් කොමිෂන් සභාව වෙත පැමිණ ලබා ගන්නා අතර, එසේ පැමිණෙන පුද්ගලයින්ට මානව හිමිකම් සම්බන්ධව දැනුවත් කිරීමේ සාකච්ඡා පැවැත්වීම.

<u>ප්‍රාදේශීය කාර්යාල</u>

**දේශනසහාය**

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්ක කණ්ඩායම | | | | |
|---|---|---|---|---|---|
| | යුධ හමුදා නිලධාරීන් | පොලිස්නිල ධාරීන් | මහජනතාව (සිවිල් සංවිධාන, ආගමික නායකයන්, වෙනත්) | සිසුන්/ තරුණ කණ්ඩායම් | සිවිල් ආරක්ෂක බලකාය |
| මාතර | - | 1 | 3 | 1 | - |
| මහනුවර | - | 1 | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | 1 | - |
| අනුරාධපුරය | 2 | 2 | - | - | - |
| අම්පාර | - | 2 | 1 | 1 | - |
| බදුල්ල | - | 1 | 1 | - | - |
| මඩකලපුව | - | - | 2 | - | - |
| වවුනියාව | 4 | - | - | - | 1 |

**දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්**

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්ක කණ්ඩායම | | |
|---|---|---|---|
| | රාජ්‍ය නිලධාරීන් | සිසුන්/ තරුණ කණ්ඩායම් | මහජනතාව (සිවිල් සංවිධාන, ආගමික නායකයන්, වෙනත්) |
| මහනුවර | - | - | 1 |
| බදුල්ල | - | - | 1 |
| කල්මුණේ | 1 | - | - |

| | | | |
|---|---|---|---|
| මඩකලපුව | - | 1 | - |
| වවුනියාව | - | 1 | 3 |

## ජංගමසේවය/වෙනත් වැඩසටහන්

| ප්‍රාදේශීය කාර්යාලය | මාතෘකා |
|---|---|
| මහනුවර | 2019.02.10 දින ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ජංගම සේවාවට සහභාගි විය. |
| | 2019.02.19දින සිවිල් සමාජ රැස්වීමපවත්වන ලදී. |
| යාපනය | 2019.02.23දින ඇඟලුම් සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවපවත්වන ලදී. |
| | 2019.03.01දින නැවත පදිංචි කිරීමේ ගැටලු සොයා බැලීමට කිලිනොච්චි ඉරනයිතීවු දූපතේ විශේෂ සංචාරයක නිරත වන ලදී. |
| | 2019.03.21 දින දිස්ත්‍රික් සංවර්ධන කමිටුරැස්වීමටසහභාගී වන ලදී. |

## ජාත්‍යන්තරදිනසැමරුම

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සියලුමප්‍රාදේශීය කාර්යාල විසින් ආබාධසහිත කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වට මේස සාකච්ඡා පවත්වා තම ප්‍රදේශයේආබාධසහිත කාන්තාවන්ටපවතින ගැටලු හඳුනාගන්නා ලදී. එයට අමතරවමාතර, ත්‍රිකුණාමලය, යාපනය, අම්පාර, කල්මුණේ, බදුල්ල, මහනුවර හා මඩකලපුව ප්‍රාදේශීය කාර්යාල විසින් ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

## උපාධිධාරී/උපාධි අපේක්ෂක ආධුනික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මාස 03ක කාලයක පුහුණු වැඩසටහනක් සඳහා උපාධි අපේක්ෂකයින් ආධුනිකයින් බඳවා ගැනීම මෙහිදී සිදුකරනු ලැබේ. මෙම බඳවාගැනීම් වලට අදාළ දැන්වීම කොමිෂන් සභා අන්තර්ජාල පිටුවේ පළ කරන අතර, ඊට අතිරේකව උපාධි ප්‍රදානය කරන ආයතන වෙත තැපැල් මඟින් අයදුම්පත් කැඳවීම් මඟින් දන්වනු ලැබේ. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල මඟින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වලින් තෝරාගනු ලබන ආධුනිකයින් මේ සඳහා බඳවාගැනීම සිදුකරයි.

ඒ අනුව මෙම වර්ෂයේ පළමු කාර්තුව සඳහා ප්‍රධාන කාර්යාලය සඳහා 22 දෙනෙක් සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා 13දෙනෙක් ආධුනික පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

## සහභාගීවූ රැස්වීම්/සාකච්ඡා සහ වැඩසටහන්

| දිනය | රැස්වීම | සහභාගී වූ නිලධාරියා |
|---|---|---|
| 2019.01.31 | අන්තර්ජාතික රතු කුරුස සමාජය මඟින් පොකුරු ආයුධ භාවිතා කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් එක්දින වැඩමුළුවක් කොළඹ දී පවත්වන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කර මේ සඳහා කැඳවීම් සිදුකරන ලදී. | අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ (වැ.බ.) |
| 2019.03.05 | 2019 කාන්තා දින වැඩසටහන සඳහා ආබාධ සහිත ප්‍රජාව තුළින් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් නියෝජිතයින් හඳුනාගැනීම සඳහා වූ රැස්වීම. මෙම රැස්වීම රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී පවත්වන ලදී. ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ආබාධ ප්‍රජාව නියෝජනය කරන සිවිල් සංවිධාන සහ ආබාධිත ප්‍රජාවේ දායකත්වය දක්නට ලැබුණි. | අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ (වැ.බ.) |
| 2019.03.18 සහ 2019.03.19 | ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම අන්තර්ජාලය තුළ සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික සැසිය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කොළඹ දී පවත්වන ලදී. | අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ (වැ.බ.) |
| 2019.03.28 | ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රතිපත්තීන්ගෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු සේවක සේවිකාවන්ට ඇති බලපෑම පිළිබඳ වැඩමුළුවක් ධාබිඳු සාමූහිකය සංවිධානය කර කොළඹ දී පවත්වන ලදී. ඇඟළුම් සේවිකාවන්, ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සිවිල් සංවිධාන සහ මෙම සේවිකාවන් වෙත සේවාවන් ලබාදිය යුතු වගකීම් දරන පාර්ශවයන් වැඩමුළුව සඳහා සම්බන්ධ විය. | අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ (වැ.බ.) |

**පර්යේෂණහාඅධීක්ෂණඅංශයවිසින්සිදුකරනලදවිශේෂකරුණුසෙවීමේමෙහෙවරයන්/ක්ෂේත්‍රපරීක්ෂණයන්**

| දිනය | මැදිහත්වීමට හේතු වූ ගැටලුව |
|---|---|
| 2019.01.23 | මස්කෙළිය ප්‍රදේශයේ සෞඛ්‍ය අංශයේ පවතින ගැටපු හඳුනාගැනීමේ අරමුණින් කරුණු සෙවීමේ මෙහෙවරක් පවත්වන ලදී. මෙහිදී මස්කෙළිය රජයේ රෝහල, මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, නල්ලතන්නිය හදිසි ප්‍රථමාධාර ඒකකය යන ස්ථාන නිරීක්ෂණය කරන ලද අතර, සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සිවිල් සංවිධාන වෙතින් තොරතුරු ලබාගන්නා ලදී. මෙම මෙහෙවර අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය එක්ව සිදුකරන ලදී. |

## ශ්‍රී ලංකාමානව හිමිකම් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවයාවත් කාලීන කිරීම

| දිනය | යාවත්කාලීන කිරීම |
|---|---|
| 2019.01.18 | 2018 නොවැම්බර් මස අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ දී සිදුවූ සිරකරුවන්ට පහරදීම සම්බන්ධ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ප්‍රකාශය |
| 2019.01.21 | 2019 අයවැය යොජනා තුළට ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ ගමනාගමන පහසුකම් සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කරන ලෙස මුදල් අමාත්‍යවරයා වෙත මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීම |
| 2019.01.30 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ පහරදීමට අදාළව සිදුකරන පරීක්ෂණය සම්බන්ධයෙන් වැරදි තොරතුරු මව්බිම පුවත්පතේ පළවීම සම්බන්ධයෙන් එහි ප්‍රධාන කර්තෘ වෙත යොමු කරන ලද ලිපිය |
| 2019.02.02 | 2019.01.20 වන ඉරුදින අරුණ පුවත්පතේ කොමිෂන් සභාව සම්බන්ධයෙන් පළවූ වැරදි තොරතුරක් සම්බන්ධයෙන් එහි ප්‍රධාන කර්තෘ වෙත යොමු කරන ලද ලිපිය |
| 2019.02.08 | 2019.02.06 වන දින ගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවේ දී සිදුකළ ප්‍රකාශය සම්බන්ධයෙන් එතුමන් වෙත යොමු කරන ලද ලිපිය |
| 2019.03.11 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2019 වසරේ සිදුකළ කාන්තා දින සැමරුම සම්බන්ධයෙන් Sunday Times පුවත්පතේ පළ වූ ලිපිය නැවත පළ කිරීම |
| 2019.03.11 | 2019.02.21 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සිසිර ජයකොඩි මහතා පළ කල ප්‍රකාශය සම්බන්ධයෙන් කතානායකතුමා වෙත යොමු කළ ලිපිය |
| 2019.03.21 | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදුකළ ප්‍රකාශයන් |
| 2019.03.22 | 2019 වාර්ෂික අයවැය වාර්තාව තුල ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් පිළිබඳ මුදල් අමාත්‍යවරයා වෙත මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්තුතිය පළ කිරීම |

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රවෘත්ති/විශේෂිත නිර්දේශ/සුවිශේෂී මැදිහත්වීම් පිළිබඳ බාහිර පාර්ශවයන් දැනුවත් කිරීම.

මෙහිදී මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය, අන්තර්ජාල පුවත්, සිවිල් සංවිධාන, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තේමාත්මක උප කමිටු සාමාජිකයින්, ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල, අන්තර්ජාතික මානව හිමිකම් සංවිධාන, ආසියා පැසිෆික් කලාපීය ජාතික මානව හිමිකම් ආයතන සන්ධානයේ සන්නිවේදන ජාලය සහ ආසියා පැසිෆික් කලාපීය ජාතික මානව හිමිකම් ආයතන සන්ධාන සමඟ මෙම තොරතුරු බෙදාගැනීම සිදුකරනු ලබයි. සෑම යාවත්කාලීන කිරීමකින්ම පසුව මෙලෙස තොරතුරු යොමුකිරීම සිදුකරනු ලැබේ.

සෑම යාවත්කාලීන කිරීමකින්ම අනතුරුව කොමිෂන් සභාවේ සියළුම ශාඛා කාර්යාල වෙත මෙම තොරතුරු යොමුකරන අතර, එම තොරතුරු කාර්යාලවල දැන්වීම් පුවරුවල මහජන ප්‍රදර්ශනය සඳහා යොමුකරන ලෙස උපදෙස් දෙනු ලැබේ.

ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාල වලට අයත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පළ කරනු ලබන මානව හිමිකම් උල්ලංඝනයන්ට අදාළ පුවත්පත් වාර්තා සම්බන්ධයෙන් මාධ්‍ය අධීක්ෂණයක් සිදුකර අදාළ වගඋත්තකාර පාර්ශවයන් වෙතින් වාර්තා කැඳවීම් සිදුකිරීම හා එහි ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකිරීම.

**ජනමාධ්‍යන්හි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ පළවූ වාර්තා**

1. අබාධිත පුද්ගලයන්ගේ ප්‍රවේශ අයිතිය තහවුරු කිරීම සඳහා අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට යොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන් 2019.01.21 හා 2019.01.27 යන දෙදින සන්ඩේ ඔබ්සවර්, සන්ඩේ ටයිම්ස්, දඅයිලන්ඩ් යන පුවත්පත් වල පළවිය.

2. ආබාධිතපුද්ගලයන්ගේප්‍රවේශඅයිතියතහවුරුකිරීමසඳහාඅයවැයමගින්ප්‍රතිපාදනවෙන්කරනලෙසමුදල්අමාත්‍යාංශයටයොමුකරන ලද ලිපිය සම්බන්ධයෙන්කොලොම්බො ටෙලිග්‍රාෆ්,කොලොම්බො පේජ්, කොලොම්බො ගැසට්යන 2019.01.21 වන දින ප්‍රවෘත්ති වෙබ් අඩවි වල පළවිය.

3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය දීපිකා උඩගම මහත්මිය සමග පවත්වන ලදසම්මුඛ සාකච්ඡාව 2019.03.10 වන දිනඉරිදා විරකේසරී පුවත්පතෙහි පළවිය.

4. ආබාධිත සහිත කාන්තාවන් ගෞරවාන්විත ජීවිතයක් ගතකිරීම යන්න තේමා කොටගෙන කොමිෂන් සභාව පැවැත්වූ ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන පිළිබඳවවාර්තාවක් 2019.03.10 වන දින සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවිය.

**සභාපතිනිය සහ කොමසාරිස්වරුන් සහභාගී වූ සාකච්ඡා/වැඩසටහන්**

| | දිනය | විස්තරය |
|---|---|---|
| 1 | 2019.01.01 | නව සීමාවාසික අභ්‍යාසලාභීන් සඳහා දිශාභිමුඛ කිරීමේ වැඩසටහන |
| 2 | 2019.01.04 | එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා සේවය සඳහා විදේශගතවන හමුදා පිරිස් නිෂ්කාශන ක්‍රියාදාමයට අදාළ කරුණු සාකච්ඡා කිරීම පිණිස ගරු කථානායකතුමා සමග රැස්වීම - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව |
| 3 | 2019.01.16 | ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම - පෙබරවාරි, සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලය, කොළඹ 02 |
| 4 | 2019.01.18 | ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ විද්වත් සමුළුව - 2019 ශ්‍රී ලංකා මහ බැංකු බැංකුකරණ අධ්‍යයන ශ්‍රවනාගාරය, රාජගිරිය |
| 5 | 2019.01.25 | මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය, නෙරළු නිවාඩු නිකේතනය, හේනේගම |
| 6 | 2019.01.25 | ඕස්ට්‍රේලියා දිනය - ඕස්ට්‍රේලියා මන්දිරය |
| 7 | 2019.01.30 | එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා සේවය සඳහා විදේශගත වන හමුදා පිරිස් නිෂ්කාශන ක්‍රියාදාමයට අදාළ කරුණු සාකච්ඡා කිරීම පිණිස ගරු කථානායකතුමා සමග රැස්වීම -ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව |
| 8 | 2019.01.31 | පොකුරු යුද්ධෝපකරණ සම්මුතිය ගෘහස්ත නීති, නීතිකරණයට ඇතුළත් කිරීම පිළිබඳ එක්දින පුහුණුව - සිනමන් ලේක් සයිඩ් හෝටලය |
| 9 | 2019.01.31 | මානව හිමිකම් සහ සහජීවනය පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාවේ අරමුණු සහ යුතුකම් (පොදු අදහස් විමසීම) රැස්වීම - මාවනැල්ල ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය |
| 10 | 2019.02.01 | මුදල් කොමිෂන් සභාව, නව ගොඩනැගිල්ලට ගෙවදීම |
| 11 | 2019.02.02 | ශ්‍රී ලංකා වෛද්‍ය නීති සංගමයේ ප්‍රධාන අමුත්තා හා ප්‍රධාන දේශකයා ලෙස - ඔපියුලන්ට් රිවර් ෆේස් හෝටලය |
| 12 | 2019.02.14 | ප්‍රජාතන්ත්‍රවාදී යුග මෙහෙවරක තිස් වසරක අතීතාවලෝකනය (සහයෝගිතාව, පුරවැසිභාවය සහ ප්‍රජාතන්ත්‍රවාදය) සැමරීම, පැෆරල් සංවිධානය - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| 13 | 2019.03.05 | නෝර්වීජියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරිය ඇතුළු නිලධාරීන් සමග සාකච්ඡාව - ගාලුමුවදොර හෝටලය |
| 14 | 2019.03.05 | “ශ්‍රී ලංකාවේ වර්තමාන මානව හිමිකම් තත්ත්වය” පිළිබඳ සාකච්ඡාවජපාන තානාපති |

| | | |
|---|---|---|
| | | කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී සහ දේශපාලන උපදේශක - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| 15 | 2019.03.08 | ජාත්‍යන්තර කාන්තා දින සැමරුම - ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 16 | 2019.03.08 | "විමර්ශී" තීරු ලිපි සංග්‍රහය ග්‍රන්ථය (මානුෂවාදී ගැටලු වාර්තාකරණයේදී ජනමාධ්‍ය සතු සමාජ වගකීම ඉටුකළ ආකාරය) එළිදැක්වීම - සීතා රංජනී මිය |
| 17 | 2019.03.09 | අතුරුදහන්වූවන්ගේ කාර්යාලයේ ආරාධනය මත ආචාර්ය ලුයිස් ෆොන්ඩේබ්‍රිඩර්ගේ සත්‍ය සොයා විද්‍යාත්මක ගවේෂණයේදී මනුෂ්‍යත්වයට ගරු කිරීම දේශනය - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| 18 | 2019.03.12 | සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලය - ජාතික මානව අයිතිවාසිකම් ක්‍රියාකාරී සැලැස්ම - මිලෝදා ආයතනය |
| 19 | 2019.03.13 සිට16 | එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ සමාරම්භක දකුණු ආසියා සංසදය - නව දිල්ලිය, ඉන්දියාව |
| 20 | 2019.03.18 | අල්ලස් කොමිෂන් සභාව - අල්ලස් සහ දූෂණය මර්දනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම - ෂැන්ග්‍රිලා හෝටලය |
| 21 | 2019.03.21 | ආසියා පැසිපික් කලාපය සංවිධානය කරන ලද කලාපීය අධිකරණ ශාස්ත්‍රීය සම්මේලනය ආමන්ත්‍රණය කිරීම - ජෙට්වින්ග් හෝටලය, කොළඹ |
| 22 | 2019.03.27 | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද එක්සත් ජාතීන්ගේ වධහිංසන වැළැක්වීම පිළිබඳ අනු කමිටුව සමග පැවැත්වූ රැස්වීම - කමිටුව (SPT) ශාලාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී |

# <u>මූල්‍ය වාර්තාව</u>

| | |
|---|---|
| **ආරම්භක ශේෂය** | **0.00** |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | **50,900,000.00** |
| ප්‍රාග්ධන | **3,200,000.00** |
| වෙනත්ආදායම් | **29,596.10** |
| එකතුව | **54,129,596.10** |
| **වියදම්** | |
| පුද්ගලික පඩනඩි | **29,258,834.74** |
| ගමන් වියදම් | **198,746.00** |
| සැපයුම් | **1,180,919.83** |
| නඩත්තු වියදම් | **865,994.48** |
| සේවා | **15,037,378.64** |
| මාරුකිරීම් | **633,638.01** |
| මානව හිමිකම් වැඩසටහන් | **2,990,617.65** |
| පුනරුත්ථාපනය හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණුව | **--** |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | **197,325.00** |
| ධාරිතා වර්ධනය | **1,021,458.25** |
| ශ්‍රී ලංකාවෙහි සාමය ගොඩනැගීම උදෙසා උත්ප්‍රේරක සහාය (UNDP) | **229,122,55** |
| දිවයිනට පෙරළා පැමිණෙන්නන්ට ස්වකීය අයිතිවාසිකම් භුක්තිවිඳීමේ අවකාශය සැලසීම (UNHCR) | **--** |
| මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම (SWISS) | **--** |
| **සමස්ත වියදම** | **51,614,035.15** |